සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

**11 ශ්‍රේණිය** **කතෝලික ධර්මය I** **කාලය පැය 1 යි**

නම/ විභාග අංකය:

- සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. ශුද්ධවූ කතෝලික සභාව අනුගමනය කරන ශුද්ධ බයිබලයේ අන්තර්ගත නොවන දේ අපට ලැබී ඇත්තේ,
(1) ජීවන සහා සම්ප්‍රදායෙනි. (2) වාචික සම්ප්‍රදායෙනි.
(3) සුබාරංචි මගිනි. (4) අපෝස්තුලුවරු මගිනි.

02. නව ගිවිසුමේ පොත් වර්ගීකරණයට අනුව ශුද්ධවූ පාවුලුතුමාගේ ලිපි ගණන,
(1) පහකි. (2) අටකි. (3) දහතුනකි. (4) විසි එකකි.

03. A - 2 තෙසලෝනික / 1 තිමති / 2 තිමති / කොලොස්සි
B - 2 තෙසලෝනික / එපීස / කොලොස්සි / පිලමොන්
C - 2 තෙසලෝනික/ 1 තිමති / 2 තිමති / තීතස්
D - 2 තෙසලෝනික/ 1 තිමති / 2 තිමති / ගලාති
ආරූඪ කතෘත්වයෙන් යුත් හසුන් ඇතුළත් වරණය තෝරන්න.
(1) A (2) B (3) C (4) D

04. ඇන්ටිඕකස් යටතේ ජුදා ජාතීන් දරුණු පීඩනයකට ලක් වූ සමයක ලියවුණු ග්‍රන්ථය ක්‍රි.පූ. 580 පමණ ඉදිරිපත් කර ඇත්තේ,
(1) තියෝපිලස්ටය (2) දානියෙල්ටය. (3) ඩොමීෂියන්ටය (4) තීතස්ටය.

05. තියුණු නැණනුවණද, ධනය හා ගෞරවයද, ආයුෂද වැඩිකරන බවට දෙවියන් වහන්සේ ප්‍රකාශ කරන්නේ,
(1) දාවිත්ට ය. (2) සාවුල්ට ය. (3) සලමොන්ට ය. (4) ජොහාන්ට ය.

06. ජේසුස් වහන්සේ පාස්කු ඉරුදිනට පසු, දින අටකින් නැවත දර්ශනයවීම තුළ ඇති වූ සිද්ධියකි.
(1) පව්කම් කිරීමේ බලය දානය කිරීම. (2) තෝමස්තුමාගේ අවිශ්වාසය දුරු කිරීම.
(3) ශුද්ධාත්ම වරම් ලබා ගැනීම. (4) අපෝස්තුලුවරු ශක්තිමත් කිරීම.

07. අභිවෘද්ධි ආලේපනය මගින්, අප ශුද්ධාත්ම වරමින් පූර්ණ කරන්නේ,
(1) අභියෝග හමුවේ විශ්වාසයට සාක්ෂි දැරීමට ය. (2) අන්‍යයන්ගේ උදහසට ලක්නොවී ජීවත්වීමට ය.
(3) මීසම් සංඝයට පමණක් සේවය කිරීමට ය. (4) කිතුනුවන්ගේ අභිවෘද්ධියට වැයවීමට ය.

08. ♦ අභියෝග හා දුක්කම්කටොළුවලට මුහුණ දීම. ♦ සිරකරනු ලැබීම.
♦ ගල් ගසා නගරයෙන් පිටතට ඇද දැමීම. ♦ ජුදයින්ගේ විරෝධයට ලක්වීම.
මෙම සිද්ධි අදාළ වන්නේ,
(1) ශුද්ධවූ ස්තේපන්තුමාට ය. (2) ශුද්ධවූ පාවුලුතුමාට ය.
(3) ශුද්ධවූ පේදුරුතුමාට ය. (4) ශුද්ධවූ සන්තියාගෝ තුමාට ය.

09. ස්වර්ගයෙහි යතුර භාර දෙන ලද පේදුරුතුමාට ............ විශේෂ බලය හිමිවුණි.
මෙහි හිස්තැනට වඩාත් සුදුසු වන්නේ,

(1) බැඳීමට ද, මිදීමට ද
(2) ප්‍රේම කිරීමට ද, පෝෂණය කිරීමට ද
(3) ප්‍රේමකිරීමට ද, මිදීමට ද
(4) බැඳීමට ද, ප්‍රේමකිරීමට ද

10. අපෝස්තුලුවරුන් හා වත්මන් ශුද්ධවූ සභාව අතර වන දූත කාර්යයේ අනන්‍යතාවය පැහැදිලි වන්නේ,

(1) ඒකත්වය මඟිනි.
(2) ශුද්ධත්වය මගිනි.
(3) අපෝස්තලිකත්වය මගිනි.
(4) කතෝලිකත්වය මගිනි.

11. ජේසුස් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනයේදී අවධාරණය කරන්නේ,

(1) පාද දෝවනය පිළිබඳව ය.
(2) ප්‍රේමයේ පනත ජීවත් කිරීම පිළිබඳව ය.
(3) දිව්‍ය සත්ප්‍රසාදයට පංගුකාරයෙකු වීම පිළිබඳව ය.
(4) අනුස්මරණය කිරීම පිළිබඳව ය.

12. යහපත් පාපොච්චාරණයක් වෙත යොමු වීමේදී,

(1) ශ්‍රාවකත්වයට සාක්ෂි දැරිය යුතුය.
(2) දෙවියන් වහන්සේට පිදෙන පඬුරක් විය යුතුය.
(3) සැබෑ මනස්ථාපනයක් හා සිත් හැරීමක් ඇති කරගත යුතුය.
(4) දුක් වේදනා දරා ගනිමින්, සැබෑ සිත් හැරීමක් ඇතිකර ගත යුතුය.

13. "නුඹේ මුළු හෘදයෙන් ද, නුඹේ මුළු ආත්මයෙන් ද, නුඹේ මුළු වීර්යයෙන් ද, නුඹේ මුළු බුද්ධියෙන් ද, නුඹේ දෙවි ස්වාමින් වහන්සේට ............... ප්‍රේම කරන්න.
මෙම ප්‍රකාශයට පදනම වන්නේ,

(1) විශ්වාසය, බලාපොරොත්තුව හා ප්‍රේමය යි.
(2) විශ්වාසය, බලාපොරොත්තුව හා ආරක්ෂාව යි.
(3) සාධාරණත්වය, බලාපොරොත්තුව හා ප්‍රේමය යි.
(4) විශ්වාසය, ප්‍රේමය හා සාධාරණත්වය යි.

14. දෛනික ජීවිතයේ දී තමාගේ ශක්තිය පිළිබඳව පමණට වඩා නොසිතා දේව කැමැත්ත ඉටු කිරීම තුළ අයිති කර ගත හැකි දේව ධර්ම ගුණයකි.

(1) ප්‍රේමය
(2) විශ්වාසය
(3) බලාපොරොත්තුව
(4) ඉවසීම

15. ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමේ අභිරහස් උගන්වමින්, යහපත් කල් ක්‍රියාව හා සහෝදරත්වය තුළ දයාවේ හා ප්‍රේමයේ ජීවිතයක් ගත කිරීමට අපට ඇරයුම් කරන්නේ,

(1) විශ්ව ලේඛන මගිනි.
(2) ශුද්ධ ලියවිල්ල මගිනි.
(3) ඉරුදින දිව්‍ය යාගය මගිනි.
(4) ජීවන සභා සම්ප්‍රදාය මගිනි.

16. සියලු කාරණාවලදී දරුවන් දෙමාපියන්ට කීකරු වීම දෙවියන් වහන්සේට ප්‍රීතියක් වන බව සඳහන් වන්නේ,

(1) කොලොස්සි ලිපියේ ය.
(2) එපීස ලිපියේ ය.
(3) හිතෝපදේශයේ ය.
(4) උපදේශකයා හෙවත් සිරාක්හිය.

17. ගබ්සාව ඝාතනයක් මෙන්ම අශික්ෂිත අපරාධයක් බවත් ගබ්සා කිරීමට දායකවීමද බරපතල පාපයක් බවත් සඳහන් කරන්නේ,

(1) ශුද්ධ ලියවිල්ලෙහි ය.
(2) විශ්ව ප්‍රකාශනවල ය.
(3) අපෝස්තලිත අනුශාසනාවල ය.
(4) කතෝලික සභා ධර්මෝපදේශයෙහි ය.

18. තමාගේම ශරීරයට විරුද්ධව කරන පාපයකි.

(1) බොරු සාක්ෂි දීම.
(2) අනාචාරයේ හැසිරීම.
(3) සොරකම් කිරීම.
(4) අන් අයගේ වස්තුව කොල්ල කෑම.

19. දෙවි ස්වාමින් වහන්සේ 7 සහ 10 යන දේව පනත් මගින් අපට නියෝග කරන්නේ,

(1) ස්වර්ගීය සම්පත් පරිහරණය කිරීම පිළිබඳව ය.
(2) නිර්මල දිවිපෙවතක් ඇතිකර ගැනීම සම්බන්ධව ය.
(3) පෞද්ගලික දේපල පරිහරණය කිරීම පිළිබඳව ය.
(4) අන්සතු දේ අයුතු ලෙස ලබා ගැනීම පිළිබඳව ය.

20. පෞද්ගලික දේපල නිවැරදිව පරිහරණය කිරීම තුළින් තව තවත් දේව ආශිර්වාදය ලබන අපි, අන්අය සමඟ බෙදා ගත යුතු වන්නේ,

(1) බාහිර දේපල හා බුද්ධිමය දේපල ය.
(2) වතුපිටි හා මිල මුදල් ය.
(3) ධනය, බලය හා කීර්තිනාමය ය.
(4) බාහිර දේපල හා මිල මුදල් ය.

21. පුරාණ ගිවිසුමෙහි ජනවන්දනාවට අදාළ නීති නියෝග පිළිබඳව කරුණු ඇතුළත් වන්නේ,

(1) උත්පත්ති පොතෙහි ය.
(2) නික්මයාම පොතෙහි ය.
(3) ලෙවී ව්‍යවස්ථාවෙහි ය.
(4) ගණන් පොතෙහි ය.

22. ද්විතීය සම්මත යනුවෙන් අදහස් කරනුයේ,

(1) දෙවනුව සම්මත වූ යන්නයි.
(2) සෙප්ටුවාජින්ත යන්නයි.
(3) මැසරොටික් යන්නයි.
(4) හෙබ්‍රෙව් පිටපත යන්නයි.

23. දේශක දිවැසිවරුන්ගේ වචන හා ක්‍රියා දක්නට ඇති ග්‍රන්ථ වන්නේ,

(1) 1 - 2 සාමුවෙල්, 1 - 2 වංශාවලිය.
(2) 1 - 2 රාජාවලිය හා වංශාවලිය
(3) 1 - 2 වංශාවලිය හා ලෙවී ව්‍යවස්ථාව
(4) 1 - 2 සාමුවෙල් හා 1 - 2 රාජාවලිය

24. මාක් සුබාරංචිය ලියා ඇති කාල වකවානුව හා ස්ථානය වන්නේ,

(1) ක්‍රි.ව. 90 - 100 එපීසිය යි.
(2) ක්‍රි.ව. 80 - 85 එපීසයේ අන්තියෝකියයි.
(3) ක්‍රි.ව. 80 - 90 සිරියා පලස්තීනයයි.
(4) ක්‍රි.ව. 64-66 රෝමයයි.

25. ශුද්ධ බයිබලයෙහි සඳහන් වන්නේ දෙවියන් වහන්සේ,

(1) ලෝකය මැවූ ආකාරයයි.
(2) ලෝකය මැවූ බවයි.
(3) මිනිසාගේ බුද්ධියේ මහිමයයි.
(4) මිනිසා පාපයට යොමුවීමයි.

26. A - යාවේ සම්ප්‍රදායේ සම්පාදනයකි.
B - මිනිසාට පමණක් ජීවන හුස්ම දානය කර ඇත.
C - මැවිල්ල දින හතකට සීමා වේ.
D - සබත් දවසේ වැදගත්කම ඉස්මතු කරයි.

ඉහත ප්‍රකාශ අතරින් මැවිල්ල පිළිබඳ දෙවන කථාවට අයත් වන්නේ,

(1) A හා B ය.
(2) B හා C ය.
(3) C හා D ය.
(4) A හා C ය.

27. උත්පත්ති පොතෙහි තුන්වන පරිච්ඡේදයේ දැක්වෙන පරිදි මිනිසා තුළ ඇති රුචිය සංකේතවත් කරන්නේ,

(1) තහනම් ගසෙනි.
(2) ඵල වලිනි.
(3) සර්පයාගෙනි.
(4) ඵල කඩා කෑමෙනි.

28. දේව පොරොන්දු ඉටුකරමින් ආබ්‍රහම්ගේ පරපුර විශාල ජාතියක් වශයෙන් සිටින ලද්දේ,

(1) සිරියාවේ ය.
(2) මිසරයේ ය.
(3) ජෙරුසලමේ ය.
(4) මසිදෝනියේ ය.

29. පාර්ශවයන් දෙකක් අතර යම් කරුණක් මුල්කර ගනිමින් කොන්දේසි සහිතව ඇති කර ගත්තා වූ එකඟතාවක් හඳුන්වන්නේ,

(1) බැඳීමක් ලෙස ය.
(2) පොරොන්දුවක් ලෙස ය.
(3) ගිවිසුමක් ලෙස ය.
(4) පක්ෂපාතී බවක් ලෙස ය.

30. ස්නාවක ජුවාම්තුමා "පොළොං වංශය" යනුවෙන් ආමන්ත්‍රණය කරනුයේ ඉශ්‍රායලයේ,
   (1) පූජකයින්ට ය. (2) ප්‍රභූ ජනතාවට ය. (3) හේවායන්ට ය. (4) අයකැමියන්ට ය.

31. අධ්‍යාත්මික ජීවිතය පෝෂණය සඳහා දේව වචනය වඩාත් වැදගත් බවට අවධාරණය කරනුයේ ජේසුස් වහන්සේ මුහුණ දුන්,
   (1) පළමු පරීක්ෂාවෙනි. (2) දෙවන පරීක්ෂාවෙනි.
   (3) තුන්වන පරීක්ෂාවෙනි. (4) ජීවිත පරිත්‍යාගයෙනි.

32. වතුරෙන් හා ආත්මයාණන්ගෙන් නූපන් අයට ස්වර්ග රාජ්‍යයට පිවිසීමට නොහැකි බවට ජේසුස් වහන්සේ ප්‍රකාශ කරන්නේ,
   (1) පරිසිවරුන්ට ය. (2) විනයධරයන්ට ය. (3) සකේවුස්ට ය. (4) නිකදේමුස්ට ය.

33. උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේගේ සලකුණ වන්නේ,
   (1) ගිනිදැල්ල ය. (2) පරවියා ය.
   (3) පාස්කු ඉටිපහන ය. (4) කුරුසිය ය.

34. සියල්ලට වැඩියෙන් දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම මුල්කරගෙන, ප්‍රේමය නිසා ඇතිවන මනස්ථාපනය හඳුන්වන්නේ,
   (1) භයාධික මනස්ථාපනය ලෙස ය. (2) දයාධික මනස්ථාපනය ලෙස ය.
   (3) ඇතුළාන්ත මනස්ථාපනය ලෙස ය. (4) සමඟි සන්ධානය ලෙස ය.

35. දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් සැලකිල්ලට ගනිමින් "රෝගීන්ගේ දිව්‍යමය ආලේපය" නැමැති අපෝස්තලික ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් කළේ,
   (1) අති උතුම් ශුද්ධවූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා ය.
   (2) අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ය.
   (3) අති උතුම් හයවන පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.
   (4) අති උතුම් දොළොස්වන පියුස් ශුද්ධෝත්තම පියතුමා ය.

36. දරු සම්පත සමිඳාණන්ගෙන් ලැබෙන දායාදයකි. ඒ සම්පත එතුමාණන්ගෙන් ලැබෙන ඉමහත් ආශිර්වාදයකි. මෙසේ සඳහන් වන්නේ,
   (1) කතෝලික සභා ධර්මෝපදේශයේ ය. (2) මහෝපදේශයේ ය.
   (3) ලූක් සුබාරංචියේ ය. (4) ගීතාවලියේ ය.

37. බාලයන්ට ඉගැන්වීම හා ජපමාලය තුළින් දේවමාතා බැතිය වර්ධනය කිරීමත්, පැතිරවීමත් මුල්කර ගනිමින් සේවය සලසන්නේ,
   (1) මරිය හමුදාව විසිනි. (2) දිව්‍ය හෘදයේ සමිතිය විසිනි.
   (3) සාන්ත වින්සන්ද පාවුලා සමිතිය විසිනි. (4) කිතුදන පුබුදුව විසිනි.

38. A - සාගිනි වූවනට ආහාර දීම. B - රෝගීන් බැලීමට යාම.
   C - වැරදි කමා කිරීම. D - මළවුන් වැළලීම.
   ඉහත සඳහන් ප්‍රකාශ අතරින් ශාරීරික පුණ්‍ය ක්‍රියා ඇතුළත් වරණය වන්නේ,
   (1) A, B හා C ය. (2) A, B හා D ය. (3) B, C හා D ය. (4) A, C හා D ය.

39. ශුද්ධවූ සභා විනය හා සෙසු කාරණා පිළිබඳව නීති රීති ඇතුළත් වන්නේ,
   (1) සභා නීති සංග්‍රහය තුළ ය. (2) විශ්ව ලේඛන තුළ ය.
   (3) කතෝලික සභා ධර්මෝපදේශය තුළ ය. (4) අපෝස්තලික ලේඛන තුළ ය.

40. අවුරුදු 18 - 60 අතර අයට එක්වරු ශීලය රැකීමට නියම වන්නේ,
   (1) අළු බදාදා සහ සෑම සිකුරාදා දිනය. (2) අළු බදාදා සහ මහ සිකුරාදා දිනය.
   (3) මහ බ්‍රහස්පතින්දා සහ මහ සිකුරාදා දිනය. (4) අළු බදාදා සහ මහ බ්‍රහස්පතින්දා දිනය.

සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

11 ශ්‍රේණිය | **කතෝලික ධර්මය II** | කාලය පැය 2 යි

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. (i) නව ගිවිසුමේ සඳහන් වෙනත් ලිපි ලියූ අපෝස්තුළුවරු දෙදෙනෙක් නම් කරන්න.

(ii) "හොක්මා" යන වචනයෙහි අර්ථයට අනුව ජීවත්වීමේ හැකියාව සඳහා අවශ්‍ය කරුණු දෙක සඳහන් කරන්න.

(iii) කුරුසිය උසුලාගෙන යාමේ සිට භූමදානය දක්වා ජේසුස් වහන්සේට සහය වූ දෙදෙනෙක් නම් කරන්න.

(iv) බ්‍රිතාන්‍ය යුගයේ දී කතෝලිකයින්ට ලැබුණු වාසි දෙකක් සඳහන් කරන්න.

(v) ප්‍රැන්සිස් නැමැති සිරකරුවාගේ විලාපය නිසා හද සසල වූයේ කාගේද? එතුමා නාසිවරුන්ගෙන් ඉල්ලා සිටියේ කුමක්ද?

(vi) වරදට වැටුණු ඒවට දෙවියන් වහන්සේ දුන් දඬුවම් දෙකක් සඳහන් කරන්න.

(vii) නික්මයාම ගමන තුළදී, ඉශ්‍රායෙල් ජනතාව බීමට ජලය ලබාගත් ස්ථාන දෙකක් නම් කරන්න.

(viii) පූජක සම්ප්‍රදායට අනුව දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමඟ ඇතිකර ගත් ගිවිසුමේ සඳහන් පොරොන්දු දෙකක් නම් කරන්න.

(ix) දසපනතෙහි අවසාන පනත් දෙක නම් කරන්න.

(x) සරු බිමෙහි වැටුණු බීජ වලින් එකකින් කී ගුණය බැගින් එල දැරීද? කරුණු දෙකක් ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

02. (i) ශුද්ධවූ පාවුලුතුමා ජෙරුසලම් නගරයේ නැවති සිටියේදී මුහුණ දුන් අභියෝග දෙකක් සඳහන් කරන්න.

(ii) ජොහාන් 21/13-14 අනුව පේදුරුතුමාට පැවරූ තුන්ප්‍රකාර කාර්යභාරයේදී ජේසුස් වහන්සේ කළ ප්‍රකාශ තුන ලියා දක්වන්න.

(iii) සුබාරංචිය පතල කිරීමේ කාර්යයේදී පරාර්ථකාමීව අන්‍යයන්ගේ සුබ සිද්ධිය සඳහා වැය විය යුත්තේ කෙසේද යන්න කරුණු පහක් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

03. (i) ජීවනදායක භෝජනය වළඳන අයකු තුළ ඇතිවන වෙනස්කම් දෙකක් නම් කරන්න.

(ii) ඉශ්‍රායෙල් ජනතාවට මිසරයේදී විදීමට සිදුවූ දුක් පීඩා තුනක් සඳහන් කරන්න.

(iii) දිව්‍ය සත්ප්‍රසාදයෙන් පෝෂණය වන ඔබ, කැඩෙන්නට, බිඳෙන්නට, වැයවෙන්නට ලැබූ කිතුනු කැඳවීමට සාක්ෂි දරණ ආකාර පහක් විස්තර කරන්න. (ලකුණු $2+3+5=10$)

04. (i) දිව්‍ය පූජා යාගයේදී දම් වර්ණය භාවිතා කරන සමය හා අර්ථය වෙන් වෙන්ව ලියා දක්වන්න.

(ii) අළු බදාදා සිට මහ බ්‍රහස්පතින්දා දින දක්වා විහිදෙන සමය සඳහා ඉදිරිපත් කර ඇති අර්ථකථන තුනක් සඳහන් කරන්න.

(iii) නිසි සූදානමකින් හා බැතිබර සිතකින් දිව්‍ය පූජාවට සහභාගීවීමෙන් සුවය, සැනසුම හා සතුට, සාමය අත්දැකිය හැකි බව ඔබේ මිතුරෙකුට පහදා දෙන ආකාරය කරුණු පහකින් විස්තර කරන්න.

(ලකුණු $2+3+5=10$)

05. (i) "පෙනීම ලබන්න, ඔබේ ශ්‍රද්ධාව ඔබ සුව කළේය.'' දියණිය, ධෛර්ය ගන්න. ඔබේ ඇදහිල්ල ඔබ සුවපත් කළේ ය." මෙයින් ප්‍රකාශ වන ප්‍රාතිහාර්ය දෙක ලියන්න.

(ii) කන්ද උඩ දේශනාවේ (මතෙව් 5/6/7 පරි:) අන්තර්ගතව ඇති ඉගැන්වීම් තුනක් සඳහන් කරන්න.

(iii) බොරු පොරොන්දු දෙමින් ජනතාව මුලා කරන සමාජ සංස්කෘතියක් තුළ මිනිස් ජීවිතවල ඇති වටිනාකම පහදා දීම සඳහා කිතුනු අප ක්‍රියාකළ යුත්තේ කෙසේද යන්න කරුණු පහක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු $2+3+5=10$)

06. (i) සමඟි සන්ධානයේ ප්‍රසාද නිධානය මගින් ලැබෙන වරප්‍රසාද දෙකක් ලියන්න.

(ii) ජනතා සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන සෙසු දේව ප්‍රසාද නිධානවලින් වෙනස්වීමට හේතු වූ කරුණු තුනක් ලියා දක්වන්න.

(iii) ප්‍රේම සබඳතා නිසා මං මුලාවී සිටින පාසල් වියේ පසුවන තරුණ පරපුරට ජීවිතයේ සැබෑ අරුත පසක් කරදීමට වැඩිහිටි කිතුනුවකු ලෙස ඔබට කළ හැකි කාර්යයන් පහක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු $2+3+5=10$)

07. කැමති මාතෘකා දෙකක් යටතේ කෙටි සටහන් ලියන්න.

(i) කිතුනු සහා එකමුතුව

(ii) ජනවන්දනා වසර

(iii) ගිහි ධර්මදූත සේවය

(iv) ශුද්ධවූ සභාවේ ශික්ෂාපද (ලකුණු $5+5=10$)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 1 ) | 02. ( 3 ) | 03. ( 3) | 04. ( 2 ) | 05. ( 3 ) | 06. ( 2 ) | 07. ( 1 ) | 08. ( 2 ) | 09. ( 1 ) | 10. ( 3 ) |
| 11. ( 2 ) | 12. ( 3 ) | 13. ( 1 ) | 14. ( 3 ) | 15. ( 3 ) | 16. ( 1 ) | 17. ( 4 ) | 18. ( 2 ) | 19. ( 3 ) | 20. ( 1 ) |
| 21. ( 3 ) | 22. ( 1 ) | 23. ( 4 ) | 24. ( 4 ) | 25. ( 2 ) | 26. ( 1 ) | 27. ( 3 ) | 28. ( 2 ) | 29. ( 3 ) | 30. ( 2 ) |
| 31. ( 1 ) | 32. ( 4 ) | 33. ( 3 ) | 34. ( 2 ) | 35. ( 3 ) | 36. ( 4 ) | 37. ( 1 ) | 38. ( 2 ) | 39. ( 1 ) | 40. ( 2 ) |

(ල. 40)

## II පත්‍රය

**01.** **(i)** ජාකොබ් / පේදුරු / ජොහාන්

(ii) සාර්ථකව හා ධර්මිෂ්ඨව

(iii) සිරේනියේ සීමොන් / අරමතියාවේ ජෝශප්

(iv) කතෝලිකයින්ට එරෙහිව පනවා තිබූ සියලු නීති අවලංගු වීම / කැමති ආගමක් ඇදහීමේ නිදහස ලැබීම.

(v) ගරු කොල්බේ පියතුමා ප්‍රැන්සිස් වෙනුවට තමා මරණයට පත් කරන ලෙස ය.

(vi) "නුඹ ගැබ් ගැනීමේ වේදනාව බොහෝ වැඩි කරන්නෙමි."
"විලි රුදාව ඇතිව නුඹ දරුවන් ප්‍රසූත කරන්නෙහි ය."
"සැමියාට ආදරය කළද ඔහු ඇයව පාලනය කරන්නේ ය."

(vii) මස්සා / මෙරිබා / මාරා

(viii) බොහෝ දරු සම්පත් දෙමි / ජාතීන් උපදවන්නෙමි

(ix) පරදාර ආලය නොකරව / අන්වස්තු ආශා නොකරව.

(x) එකකින් සිය ගුණයක්ද / එකකින් හැට ගුණයක් ද/ එකකින් තිස් ගුණයක්ද එල දැරීය.

02. (i) දේව මාලිගාවේදී සිරගත කිරීම / අත් අඩංගුවට ගැනීම

(ii) මගේ බැටළු පැටවුන් පෝෂණය කරන්න. / මගේ බැටළුවන්ගේ එඬේරා වන්න / මගේ බැටළුවන් පෝෂණය කරන්න.

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න.

03. (i) සාගිනි නොවීම / පිපාස නොවීම (ජොහාන් 6:35)

(ii) විවිධ කර්මාන්තවල යෙදීම / ගබඩා නගර ඉදි කිරීම / බර වැඩ කිරීම / බලහත්කාරයෙන් වැඩ කිරීම.

(iii) අන් අය වෙනුවෙන් තම කාලය ශ්‍රමය වැය කිරීම.
අන් අයගේ සුබ සිද්ධිය උදෙසා නිතර කටයුතු කිරීම.
පෙරමුණ ගැනීම යනාදි පිළිතුරු අනුව ලකුණු පිරිනමන්න.

04. (i) සමය — ආගමන සමය
චතාරික සමය
අර්ථය - පශ්චත්තාපය සහ බලාපොරොත්තුව

(ii) ප්‍රසිද්ධ ජීවිතය අරඹන්නට පෙර ජේසුස් වහන්සේ පාළුකරයේ ගතකළ යාච්ඤාවේ හ මර්ධනාවේ ජීවිතයට සමවැදෙන කාලයකි. (10 පෙළපොතේ - 108)

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න.

05. (i) ජෙරිකෝවේ අන්ධයාට සුවය
සළුවට අත ගැසූ ස්ත්‍රීයට සුවය

(ii) භාග්‍ය අට / පොළොවේ ලුණු සහ ලෝකයේ ආලෝකය / පළිගැනීම පිළිබඳ ඉගැන්වීම / සතුරන් කෙරෙහි මෙත් සිත් වැඩීම / දන් දීම පිළිබඳ ඉගැන්වීම / උපවාසය පිළිබඳ සහා සම්පත් / කරදර වීම / රන් අණ / පටු දොරටුව / අත්තිවාරම් දෙක (11 පෙළ පොත 54 පිටුව බලන්න.)

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න.

06. (i) බිඳ වැටුණු සබඳතාව නැවත ගොඩ නැගීම / පව්වලට සමාව ලැබීම / ඇතුළාන්ත සැනසීම ලැබීම / නැවත පව් නොකිරීමට ශක්තිය ලැබීම.

(ii) ධර්මදූත මෙහෙවරක් පැවරෙයි. / දේව ජනතාව ගොඩනගයි. / අන් අය ගැලවීම තුළින් තම ගැලවීම සලසාගනියි.

(iii) ජීවිතයේ වටිනාකම අවබෝධ කරදීම. / ජීවිතය දෙවිඳුන්ගෙන් ලද තිළිණයක් බව වටහාදීම. / පාසල් වියේ දරුවන් ඉගෙනීමට මුල් තැන දී කටයුතු කිරීම වටිනා බව පෙන්වා දීම.... වැනි කරුණු අනුව ලකුණු ලබා දෙන්න.

07. (i) කිතුනු සහා එකමුතිව 10 - (123) (ii) ජනවන්දනා වර්ෂය 10 - (105)

(iii) ගිහි ධර්මදූත සේවා 11 - (86) (iv) ශුද්ධවූ සභාවේ ශික්ෂාපද 11 - (104)